ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක : 02/2018

මගේ අංකය: PA/CS/POLICY/කා.ක.ඉම් විභාග IV
ඒකාබද්ධ සේවා අංශය
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.06.04 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට/ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම</u>**

සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට පහත කොන්දේසි යටතේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සහ අන්තර්ග්‍රහණයෙන් පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අනුයාත විභාග අවස්ථා 06ක සහන කාලයක් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට /III වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම / සම්පූර්ණ කිරීම ප්‍රමාදවීම හේතුවෙන්;

i. පරිවාස කාලය දීර්ඝ කළ / වැටුප් වර්ධක විලම්භනය වූ නිලධාරීන් ද
ii. ඒ හේතුවෙන් සාමාන්‍ය කාර්ය සාධනය මත II වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය ජ්‍යෙෂ්ඨත්වයට බලපාන පරිදි දීර්ඝ කළ පරිවාස කාලය / විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය මත II වන ශ්‍රේණියේ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 2013.04.02 දින සිට ක්‍රියාත්මක අංක. 1840/34 හා 2013.12.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 10.1 වගන්තිවල සඳහන්) <u>පමණක්</u> යථාවත් කරගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

03. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් ද අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේ දී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද පහත දක්වා ඇති අහිමි වූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භන හේතුවෙන් අහිමි වූ, වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.2 හෝ 12.2 වගන්ති යටතේ සඳහන් හෝ වෙනත්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට / සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන / නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම් / වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කරන අභියාචනා.

04. 2003.05.01 දිනට පෙර සෞඛ්‍ය ලිපිකාර සේවයේ II'ආ' ඛණ්ඩයට බඳවා ගන්නා ලද 2003.05.01 දින සිට සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට ද 2003.05.01 දින සිට මෙම චක්‍රලේඛය යටතේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා මෙමගින් අනුයාත විභාග අවස්ථා 06ක් හිමිවන නමුත්, එදිනට එනම් 2003.05.01 දිනට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම සම්බන්ධයෙන් වූ කිසියම් වැටුප් වර්ධක විලම්භනයක් වේ නම් එය එසේම පවතිනු ඇති අතර මෙමගින් ඊට සහනයක් හිමි නොවනු ඇත.

05. තව ද ඉහත සඳහන් අනුයාත විභාග අවස්ථා 06 ගණනය කිරීමේ දී ප්‍රාථමික / III වන ශ්‍රේණියට පත් වූ දින සිට පැවැත්වූ පූර්ව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය යටතේ ලද විභාග අවස්ථා ද පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය යටතේ ලද විභාග අවස්ථා ද ඇතුළුව සේවාවන් දෙකෙහිම III වන පන්තියට අදාළ අනුයාත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ විභාග අවස්ථා ගණන 06ක් විය යුතු අතර එය ඉක්මවා යාමට මෙමගින් අවස්ථාවක් හිමි නොවනු ඇත.

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත්:**

සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත - දැ.ගැ.ස. සහ අ.ක.ස.